# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/74 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එප්පාවල වෙහෙරගල රජමහා විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ‘‘එප්පාවල වෙහෙරගල රජමහා විහාර පූජාභූමිය” යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

*එප්පාවල වෙහෙරගල රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය*

මිනින්දෝරු ජනරාල්ගේ 2013 අප්‍රේල් මස 30 වැනි දින අංක Aa/TLW/2013/331 දරන සැලැසුමේ උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 397 අධිරාණිගම ග්‍රාම නිලධාරි වසමේ, ආචාරියාගම ග්‍රාමයේ පිහිටි පහත දැක්වෙන කැබලි අංක 296, 297, 298 හා 299 කොටස්වල දක්වා ඇති හෙක්ටයාර් 11.4376 ක විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

*I කොටස*

**කැබලි අංක 296**

| | |
|---|---|
| උතුරට | : 192, 125 සහ 189 වැනි බිම් කැබලි ; |
| නැගෙනහිරට | : 189, 41 සහ 187 වැනි බිම් කැබලි ; |
| දකුණට | : 299 සහ 297 වැනි බිම් කැබලි ; |
| බස්නාහිරට | : 297, 194, 191 සහ 192 වැනි බිම් කැබලි. |

1A - G 20172 — 50 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*II කොටස*

**කැබලි අංක 297**

මාර්ගය

*III කොටස*

**කැබලි අංක 298**

| | | |
|---|---|---|
| උතුරට | : | 195 සහ 297 වැනි බිම් කැබලි ; |
| නැගෙනහිරට | : | 297 වැනි බිම් කැබැල්ල ; |
| දකුණට | : | 287 සහ 288 වැනි බිම් කැබලි ; |
| බස්නාහිරට | : | 287, සහ 288, 196 සහ 195 වැනි බිම් කැබලි. |

*IV කොටස*

**කැබලි අංක 299**

| | | |
|---|---|---|
| උතුරට | : | 297, 296 සහ 187 වැනි බිම් කැබලි ; |
| නැගෙනහිරට | : | 296, 187 වැනි බිම් කැබලි සහ කසි 110114 කලාපය 01 ; |
| දකුණට | : | කසි 110114 කලාපය 01 සහ අ.ග.පි. 394 කටියාව ; |
| බස්නාහිරට | : | අ.ග.පි. 394 කටියාව, 287 සහ 297 වැනි බිම් කැබලි. |

09 - 497

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.